# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2382/32 - 2024 මැයි මස 03 වැනි සිකුරාදා - 2024.05.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වන වගන්තිය සමඟ කියවිය යුතු 41 වන වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**හරීන් ප්‍රනාන්දු (පා.ම.),**
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2024 මැයි මස 03 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. 2024 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග ලෙස මෙම නියෝග හඳුන්වනු ලැබේ.

**I වන කොටස**
***ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලන ලියාපදිංචි කිරීම***

2. (1) මෙහි II වන උපලේඛනයේ විස්තර කර ඇති යම් ක්‍රීඩාවක් සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් ලියාපදිංචි කිරීම සඳහා වන සෑම අයදුම්පත්‍රයක් ම-

(i) ක්‍රීඩා විෂය පවරා ඇති අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය;

(ii) මෙහි I වන උපලේඛනයේ දැක්වෙන 'අ' ආකෘතියට සාරානුකූල විය යුතුය;

(iii) එම ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ සභාපති සහ ලේකම් විසින් අත්සන් කරනු ලැබිය යුතුය; සහ



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(iv) පහත දැක්වෙන ලේඛන ඒ සමග ඉදිරිපත් කරනු ලැබිය යුතුය:-

(අ) මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කරුණු අන්තර්ගත ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ ව්‍යවස්ථාවේ පිටපතක්;

(ආ) එම ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ නම, කාර්යාලයීය ලිපිනය සහ සන්නිවේදනය සඳහා වන තොරතුරු;

(ඇ) එම ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ වත්මන් කමිටු සාමාජිකයන්ගේ නම්, ලිපින සහ සන්නිවේදනය සඳහා වන තොරතුරු;

(ඈ) එම කමිටු සාමාජිකයන් පත් කර ගනු ලැබූ වාර්ෂික මහා සභා රැස්වීමේ වාර්තාවන්හි සහතික කරන ලද පිටපතක්;

(ඉ) එම ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ පසුගිය වර්ෂය සඳහා වන විගණිත මූල්‍ය ප්‍රකාශනයන්හි සහතික කරන ලද පිටපතක්;

(ඊ) එම සංගමයට අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජ සහ අනෙකුත් සංවිධානවල නම්, ලිපින සහ වෙනත් සන්නිවේදනය සඳහා වන තොරතුරු ඇතුළු එම අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජවල සහ වෙනත් සංවිධානවල කමිටු සාමාජිකයන්ගේ නම්, ලිපින සහ සන්නිවේදනය සඳහා වන තොරතුරු.

(2) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත ක්‍රීඩා අධ්‍යක්‍ෂ ජනරාල්වරයා වෙත භාර දිය යුතුය.

(3) ඕනෑම ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් ලියාපදිංචි කිරීමට පෙර අධ්‍යක්ෂ ජනරාල්වාරයාට අවශ්‍ය විය හැකි අමතර තොරතුරු ඉල්ලා සිටිය හැකිය.

(4) ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීම සිදු කරනු ලබන ජාතික ක්‍රීඩා සංගමය/සම්මේලනය පනතේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව කටයුතු කර ඇති බවට අමාත්‍යවරයා සෑහීමකට පත් වන්නේ නම්, ලියාපදිංචි ගාස්තුව වශයෙන් ජාතික ක්‍රීඩා අරමුදලට බැර විය යුතු රුපියල් පනස් දහසක (රු. 50,000/-) මුදලක් ගෙවන ලෙස අදාළ ජාතික ක්‍රීඩා සංගමය/ සම්මේලනය වෙත දන්වන ලෙස අමාත්‍යවරයා විසින් අධ්‍යක්‍ෂ ජනරාල්වරයා වෙත නියම කරනු ලැබිය යුතුය.

(5) ලියාපදිංචි ගාස්තුව ලැබීමෙන් පසුව, අධ්‍යක්‍ෂ ජනරාල්වාරයා විසින් එම ජාතික ක්‍රීඩා සංගමය/ සම්මේලනය ලියාපදිංචි කළ යුතු අතර මෙහි I වන උපලේඛනයේ දැක්වෙන 'ආ' ආකෘතියට සාරානුකූල විය යුතු ලියාපදිංචි කිරීමේ සහතිකයක් එම ජාතික ක්‍රීඩා සංගමය වෙත නිකුත් කරනු ලැබීමට ද, කටයුතු සැලැස්විය යුතුය.

(6) එම සහතිකය කලින් අවලංගු කරනු නොලබන්නේ නම් හෝ අත්හිටුවනු නොලබන්නේ නම් එම සහතිකයේ නිශ්චිතව දක්වා ඇති ජාතික ක්‍රීඩා සංගමය/ සම්මේලනය විධිමත් පරිදි ලියාපදිංචි කර ඇති බවට සියලු පරමාර්ථ සඳහා තීරණාත්මක සාක්ෂියක් විය යුතුය.

(7) අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින්, ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලීමක් ලැබී දින හැටක් ඇතුළත එම ඉල්ලීමට අත්සන් කළ සහ එය ඉදිරිපත් කළ සභාපතිවරයාට සහ ලේකම්වරයාට එම ඉල්ලීම සම්බන්ධ තීරණය දැනුම් දිය යුතුය.

(8) ජාතික ක්‍රීඩා සංගමයක්/සම්මේලනයක් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පතක් ලැබුණු විටෙක, ඉහත කී ගාස්තු ගෙවීමෙන් පසු පහත දැක්වෙන නිර්ණායක පදනම් කරගෙන එකී සංගමය/ සම්මේලනය වර්ගීකරණය කිරීමෙන් අනතුරුව එම සංගමය/සම්මේලනය ලියාපදිංචි කරන ලෙස අධ්‍යක්‍ෂ ජනරාල් විසින් ක්‍රීඩා අමාත්‍යවරයාට නිර්දේශ කරනු ලැබිය යුතුය.

(i) A ශ්‍රේණිය - සාමාජිකයන්/ ක්‍රීඩා සමාජ/අනුබද්ධ ආයතන 25ක් හෝ ඊට වැඩි ගණනක් සහිත වාර්ෂික පිරිවැටුම රු. මිලියන 50ක් හෝ ඊට වැඩි

(ii) B ශ්‍රේණිය - සාමාජිකයන්/ ක්‍රීඩා සමාජ/අනුබද්ධ ආයතන 15ක් හෝ ඊට වැඩි ගණනක් සහිත වාර්ෂික පිරිවැටුම රු. මිලියන 10ක් හෝ ඊට වැඩි එහෙත් රු. මිලියන 50ට අඩු

(iii) C ශ්‍රේණිය - සාමාජිකයන්/ ක්‍රීඩා සමාජ/අනුබද්ධ ආයතන ඕනෑම සංඛ්‍යාවක් සහිත වාර්ෂික පිරිවැටුම රු. මිලියන 10ට අඩු

එසේ වී නමුත්, ජාත්‍යන්තර තරඟයක දී කිසියම් තනි පුද්ගලයෙකුගේ හෝ කණ්ඩායමක පරිසාධනය සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින් එකී ක්‍රීඩාවට අදාළ ජාතික සංගමය අදාළ පරිද්දෙන් උසස් කරනු ලැබිය හැකිය (අදාළ වන පරිදි A ශ්‍රේණිය හෝ B ශ්‍රේණියට)

මෙම නියෝගය රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරනු ලබන දිනයේ සිට සති තුනක් ඇතුළත ක්‍රීඩා අධ්‍යක්‍ෂ ජනරාල් විසින් අමාත්‍යවරයාගේ අදහස් විමසා, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැනටමත් ලියාපදිංචි වී ඇති සියලු ජාතික ක්‍රීඩා සංගම් පිළිබඳ තක්සේරු/ ඇගයීම් කිරීම් කොට වර්ගීකරණය කිරීම සඳහා සාමාජිකයන් 05 දෙනෙකුට නොවැඩි කමිටුවක් පත් කළ යුතු වේ. ඉහත කී කමිටුව විසින් ලියාපදිංචි වී ඇති සංගම් වර්ගීකරණය පිළිබඳ කටයුතු නිම කොට එම නිර්දේශ එකී වර්ගීකරණය පිළිබඳව සමාලෝචනය කරනු වස් ලිපිලේඛන තමන්ට යොමු කළ දින සිට සතියක් ඇතුළත අධ්‍යක්‍ෂ ජනරාල් වෙත දැන්විය යුතුය. පවතින ශ්‍රේණිගත කිරීම මෙහි සඳහන් පරිදි හෝ සෑම වසර පහකට (05) වරක් සිදු කරන ඇගයීමක දී හෝ වෙනස් නොකළහොත් අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත.

(9) අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් ක්‍රීඩා අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇති ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලන පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. එම ලේඛනය මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති 'ඇ' ආකෘතියට සාරානුකූල විය යුතුය.

## II වන කොටස

***ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ ව්‍යවස්ථාව***

3. (1) සෑම ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් සඳහාම මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති විස්තර ඇතුළත් ව්‍යවස්ථාවක් තිබිය යුතු අතර එය අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතුය:

එසේ වුවද, මේ නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන දින වන විට යම් නිශ්චිත ක්‍රීඩාවක් සඳහා ලියාපදිංචි වී ඇති යම් ජාතික ක්‍රීඩා සංගමයක්/සම්මේලනයක්-

(i) මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති විස්තර ඇතුළත් ව්‍යවස්ථාව ලියාපදිංචිය සඳහා; සහ

(ii) වර්තමාන ජාත්‍යන්තර ශ්‍රේණි මට්ටම, අදාළ කාලසීමාව තුළ දී අපේක්ෂිත ඉලක්කය සහ කාර්ය සාධන මට්ටම වැඩි දියුණු කිරීම සඳහා වන උපායමාර්ග ඇතුළත් වූ ඉදිරි වසර දහයක කාලසීමාව සඳහා වන සංයුක්ත සැලැස්මක් අනුමැතිය සඳහා,

මෙම නියෝග ක්‍රියාත්මක වන දින සිට මාස තුනක් ඇතුළත අධ්‍යක්‍ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) සෑම ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් ම සිය අදාළ අන්තර්ජාතික ක්‍රීඩා ඒකාබද්ධ සංගමයේ නියමයන්, ප්‍රඥප්ති, කාර්ය පටිපාටි, රීති හෝ නියෝග අනුව සිය ව්‍යවස්ථාව සැකසීම හෝ සංශෝධනය කිරීම සිදු කළ යුතු අතර එය තම විශේෂ මහා සභා රැස්වීමේ දී අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(3) ව්‍යවස්ථාව අනුමත කරන ලද දිනයේ සිට දින හතළිස් පහක් ඇතුළත එම ව්‍යවස්ථාව ලියාපදිංචි කිරීම සඳහා අධ්‍යක්‍ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

4. සෑම ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් ම එම ජාතික ක්‍රීඩා සංගමයේ ව්‍යවස්ථාව විසින් තීරණය කරනු ලැබිය හැකි නිශ්චිත ක්‍රීඩාවට අදාළ අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජ හෝ වෙනත් සංවිධානවලින් සමන්විත විය යුතු ය.

5. (1) (අ) සෑම ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් ම පහත දැක්වෙන නිලධරයන් ද ඇතුළුව තම ව්‍යවස්ථාවේ දක්වා ඇති නිලධරයන් සංඛ්‍යාවන්ගෙන් සමන්විත වන විධායක කමිටුවක් තෝරා පත් කරගත යුතුය.

(i) සභාපතිවරයා සහ උප සභාපතිවරයා;

(ii) ලේකම් සහ සහකාර ලේකම්;

(iii) භාණ්ඩාගාරික සහ සහකාර භාණ්ඩාගාරික

(අ) A සහ B ශ්‍රේණියේ ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් සඳහා වන භාණ්ඩාගාරිකවරයා ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජිකයෙකු හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකය ඇති භාණ්ඩාගාරිකවරයෙකු හෝ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද බැංකුකරණය

සහ මූල්‍ය පිළිබඳ සහතිකයක් හෝ ඊට ඉහළ සහතිකයක් තිබිය යුතු අතර සහකාර භාණ්ඩාගාරිකවරයා මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුනක පළපුරුද්දක් ඇති තැනැත්තෙකු විය යුතුය.

(ආ) C ශ්‍රේණියේ ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් සඳහා වන භාණ්ඩාගාරිකවරයා ගිණුම් කළමනාකරුවකු ලෙස අවම වශයෙන් වසර තුනක පළපුරුද්දක් සහිත වීම 1988 අංක 30 දරන බැංකු පනතේ ප්‍රතිපාදන යටතේ පිළිගත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂ බැංකුවක හෝ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ ප්‍රතිපාදන යටතේ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක හෝ 2000 අංක 56 දරන කල්බදු මූල්‍ය පනතේ ප්‍රතිපාදන යටතේ ලියාපදිංචි කල්බදු මූල්‍ය ආයතනයක හෝ 2007 අංක 07 දරන සමාගම් පනතේ ප්‍රතිපාදන යටතේ සංස්ථාපිත සමාගමක ගිණුම් ලිපිකරුවකු විය යුතු අතර සහකාර භාණ්ඩාගාරිකවරයා මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුනක පළපුරුද්ද ඇති තැනැත්තෙකු විය යුතුය.

(2) (i) විධායක කමිටුවේ සෑම නිලධාරියෙකු ම මහා සභා රැස්වීමේ දී පවත්වනු ලබන නිලවරණයේ දී වසර 4ක කාලයක් සඳහා පත් කරගත යුතු ය.

(ii) යම් නිලධාරියෙකු;

(අ) වසර 8ක කාලයක් සඳහා සභාපති ධූරය දරා ඇත්නම්, එවැනි තැනැත්තෙකු සභාපති ලෙස නැවත තෝරා පත්කර ගැනීමට සුදුසුකම් නොලබන්නේ ය. එහෙත් ඔහු විධායක කමිටුවේ සාමාජිකයෙකු ලෙස තෝරා පත්කර ගැනීමට සුදුසුකම් ලබන්නේ ය.

(ආ) වසර 8ක කාලයක් සඳහා ලේකම් ධූරය දරා ඇත්නම්, එවැනි තැනැත්තෙකු ලේකම් ලෙස නැවත තෝරා පත්කර ගැනීමට සුදුසුකම් නොලබන්නේ ය. එහෙත් ඔහු විධායක කමිටුවේ සභාපති ලෙස හෝ සාමාජිකයෙකු ලෙස තෝරා පත්කර ගැනීමට සුදුසුකම් ලබන්නේ ය.

(ඇ) වසර දහසයක (16) කාලයක් ධූරය දරා ඇත්නම්, එවැනි තැනැත්තෙකු විධායක කමිටුවේ සාමාජිකයෙකු ලෙස තෝරා පත්කර ගැනීමට කිසිදු ලෙසකින් සුදුසුකම් නොලබන්නේ ය.

සැක සහිත බවින් වැළකීම සඳහා, කිසිදු පුද්ගලයෙකුට වසර 16ක සම්පූර්ණ කාල සීමාවකට වඩා වැඩි කාලයක් විධායක කමිටු සාමාජිකයෙකු ලෙස නිලතල දැරීමට නොහැකිය.

කෙසේ වෙතත්, මෙම රෙගුලාසි ක්‍රියාත්මක වන දිනට නිලවරණයෙන් පත් කරගෙන ඇති සභාපති ඇතුළු නිලධාරීන් සම්බන්ධයෙන් ඔවුන් දැනට පත් වී ඇති ධූර කාලය අවසන් වන තුරු එකී තනතුරු දැරීමට ඉහත රෙගුලාසිය බාධාවක් නොවනු ඇත.

(iii) කෙසේ වෙතත්, ක්‍රීඩා පනත මගින් සහ ඒ යටතේ පත් කරන ලද ඕනෑම පිළිගත් කමිටුවක් විසින්; හෝ අදාළ ජාත්‍යන්තර සංගමය මගින් හෝ ඒ යටතේ පවතින අනුබද්ධ ජාත්‍යන්තර සංගමයක් මගින් පවත්වන ලද විධිමත් පරීක්ෂණයක් මගින් හෝ ජාතික සංගමයේ විනය කමිටුව විසින් පනවන ලද විනය හේතු මත හේ ඉවත් කරනු ලැබූ හෝ දණ්ඩනයකට ලක් කරන ලද හෝ තහනමකට ලක් කරන ලද යම් නිලධාරියෙකු හෝ කමිටු සාමාජිකයෙකු එවැනි ධූරයක් සඳහා හෝ කමිටු සාමාජිකත්වය සඳහා නැවත තෝරා ගැනීමට සුදුසුකම් නොලබන්නේ ය.

(iv) යම් ජාතික ක්‍රීඩා සංගමයක/සම්මේලනයක සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු ඕනෑම විධායක කමිටු සාමාජිකයකු ක්‍රීඩා පනත, රෙගුලාසි, නියෝග සහ ජාතික ක්‍රීඩා සංගමයේ/සම්මේලනයේ ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කරන අවස්ථාවක දී සරල බහුතරයකින් යුත් යෝජනාවකින් මහා සභා රැස්වීමක් කැඳවීමෙන් සහ ඡන්දය භාවිත කිරීමට හිමිකම් ඇති, ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ 2/3 බහුතර ඡන්දයෙන් එවැනි යෝජනාවක් සම්මත කිරීමෙන් හෝ මහා සභා රැස්වීමක දී හෝ අදාළ ධූර කාලය සම්පූර්ණ වීමට ප්‍රථම එවැනි නිලධාරියකු ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(v) කිසිදු තැනැත්තෙකුට ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලන එකකට වඩා වැඩි ගණනක විධායක කමිටු සාමාජිකයකු ලෙස එකවර ධූර දැරිය නොහැක.

(3) සභාපති, ලේකම් හෝ භාණ්ඩාගාරික ධූරයේ සිදුවන ඕනෑම පුරප්පාඩුවක් විශේෂ මහා සභා රැස්වීමක දී පුරවනු ලැබිය හැකිය. වෙනත් ඕනෑම පුරප්පාඩුවත් වාර්ෂික මහා සභා රැස්වීමේ දී අනුමත කිරීමට යටත් ව කාරක සභා රැස්වීමක දී පුරවනු ලැබිය හැකි ය.

(4) යම් පුද්ගලයෙකු ජාතික ක්‍රීඩා සංගමයකට/සම්මේලනයකට තෝරා පත්කර ගැනීමට හෝ අන් ආකාරයකින් ගෙවීම් ලබන හෝ නොලබන කිසිදු ධූරයක් දැරීමට හෝ ධූරයක් අඛණ්ඩව දැරීමට හෝ ගෙවීම් ලබන හෝ නොලබන කිසිදු තනතුරක් දැරීමට හෝ කිසියම් ජාතික ක්‍රීඩා සංගමයක/සම්මේලනයක කමිටුවක සාමාජිකයෙකු වීමට හෝ ජාතික ක්‍රීඩා සංගමයක/ සම්මේලනයක අනුබද්ධ සමාජයක හෝ සංවිධානයක නාමිකයෙකු වීමට හෝ ඔහු හෝ ඇය පහත පරිදි නුසුදුස්සකු වි යුතුය.

(අ) නිසි බලයලත් අධිකරණයක් විසින් සිහි විකල තැනැත්තෙකු හෝ එවැනි තැනැත්තෙකු වශයෙන් විනිශ්චය කරනු ලැබ ඇත්නම්;

(ආ) නිසි බලයලත් අධිකරණයක් විසින් බුන්වත් තැනැත්තෙකු හෝ එවැනි බුන්වත් තැනැත්තෙකු වශයෙන් විනිශ්චය කරනු ලැබ ඇත්නම්;

(ඇ) පසුගිය වසර හතරක කාල සීමාව තුළ යම් වරදක් සඳහා අධිකරණය මගින් වරදකරුවකු කරනු ලැබ ඇති සහ මාස හයකට නොඅඩු කාලසීමාවක් සඳහා සිර දඬුවමක් නියම වී ඇත්නම්;

(ඈ) මාස හයකට නොඅඩු කාලසීමාවක් සඳහා සිර දඬුවමකට යටත් කළ හැකි වරදක් සම්බන්ධයෙන් නිසි අධිකරණ බලයලත් අධිකරණයක් හෝ හමුදා විනිශ්චය සභාවකින් වරදකරුවකු වී ඇත්නම්;

(ඉ) ක්‍රීඩා පනත යටතේ හෝ සංශෝධිත පරිදි ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත යටතේ යම් වරදකට වරදකරුවකු වී ඇත්නම්;

(ඊ) මීට පෙර ජාතික ක්‍රීඩා සංගමයක/සම්මේලනයක කමිටුවේ ධූරයක් දරා සිටිය දී එම ජාතික ක්‍රීඩා සංගමය/සම්මේලනය විසින් පත් කරන ලද නිසි බලය ලත් කමිටුවක් විසින් සිදුකරන ලද විධිමත් පරීක්ෂණයකින් පසු එම පරීක්ෂණයේ ප්‍රතිඵල මත, අයුතු මූල්‍ය අපරාධයකට, අයථා ක්‍රියාවකට, දූෂිත ක්‍රියාවකට, විනය කඩකිරීමටකට හෝ වෙනත් එවැනි යම් වරදකට වරදකරුවකු කරනු ලැබ ඔහු එම ධූරය දැරීමට නුසුදුස්සෙකු බවට පත් වූයේ නම්;

(උ) ජාතික ක්‍රීඩා සංගමයක/සම්මේලනයක ධූරයක් දරන්නෙකු වී සිටියදී ක්‍රීඩා පනතේ 32 වගන්තිය යටතේ ලිඛිත දැන්වීමක් නිකුත් කරනු ලැබ ඇති සහ ක්‍රීඩා පනතේ 32 (අ), (ආ) සහ (ඇ) වගන්ති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා සංගමය/සම්මේලනය, ක්‍රීඩා අමාත්‍යාංශය හෝ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පත් කරන ලද විධිමත් කමිටුවක් විසින් පවත්වන ලද පරීක්ෂණයකින් වරදකරුවකු වු ඕනෑම විධායක කමිටු සාමාජිකයකු;

(ඌ) නාම යෝජනා ඉදිරිපත් කිරීමට පෙර වසර දෙකක කාල සීමාවක් තුළ මාධ්‍ය සංවිධානයකට අනුයුක්තව ගෙවීම් ලබන වෘත්තීය මාධ්‍යවේදියෙකු හෝ විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය නිදහස් පුවත්පත් කලාවේදියෙකු ලෙස යම් මාධ්‍ය සංවිධානයකට හෝ මාධ්‍ය සංවිධානයක හිමිකරුවකු හෝ අර්ථලාභී හිමිකරුවකු හෝ සම අයිතිකරුවකු හෝ ප්‍රධාන කොටස්කරුවකු වශයෙන් හෝ කටයුතු කර ඇත්නම්;

(එ) අදාළ ක්‍රීඩාවල ජාතික සංචිතයේ හෝ ජාතික කණ්ඩායමේ තරගකරුවකුගේ දෙමාපියෙකු හෝ සහෝදර සහෝදරියක වේ නම්;

(ඒ) නාම යෝජනා ඉදිරිපත් කිරීමට පෙර වසර දෙකක කාල සීමාව තුළ එම ජාතික සංගමයේ/සම්මේලනයේ වෘත්තීය පුහුණුකරුවකු වශයෙන් කටයුතු කර ඇත්නම්;

(ඔ) ක්‍රීඩකයෙකුගේ නියෝජිතයෙකු හෝ කළමනාකරුවකු වේ නම්;

(ඕ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවේ නම් හෝ පුරවැසියෙකු වීම අවසන් වුවහොත්;

(ක) නාමයෝජනා ඉදිරිපත් කිරීමට පෙර වසර හතරක කාල සීමාව තුළ දී එම ක්‍රීඩාවට අදාළ ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ වෙනත් යම් අයිතම හෝ උපකරණ අදාළ ජාතික ක්‍රීඩා සංගමයට/සම්මේලනයට අලෙවි කිරීමේ හෝ සැපයීමේ යෙදී ඇත්නම් හෝ ක්‍රීඩාවලට සම්බන්ධ පුහුණු වැඩසටහන් හෝ අධ්‍යයනයන් හෝ ක්‍රීඩා සම්බන්ධ සේවා සැපයීමේ යෙදී ඇත්නම්;

(ග) ඔට්ටු ඇල්ලීම, සූදු ක්‍රීඩාව හෝ පරදු තැබීමට උනන්දුවක් ඇති හෝ ඔට්ටු ඇල්ලීමේ, සූදු ක්‍රීඩා කිරීමේ හෝ පරදු තැබීමේ සංවිධානයක සිටින හෝ එවැනි සංවිධානයක හෝ සංවිධානවල එදිනෙදා කටයුතුවල සේවයේ යොදවා ඇති පවුලේ ළඟම සාමාජිකයෙකු සිටී නම්; (කලත්‍රයා, දෙමාපියන්, සහෝදර සහෝදරියන්, පුතා හෝ දුව හෝ බෑණා හෝ ලේලියක වන)

(ච) ක්‍රීඩා අමාත්‍යාංශයේ සේවයේ නියුතු හෝ ඊට පත් කරනු ලැබ ඇති රාජ්‍ය සේවකයෙකු වේ නම්;

(ජ) ජාතික ක්‍රීඩා සංගමයේ/සම්මේලනයේ තීරණ ගැනීමේ අධිකාරිය විසින් හෝ එම ජාතික සංගමය/සම්මේලනය විසින් ස්ථාපිත නිසි බලයලත් මණ්ඩලයක් විසින් හෝ එම ජාතික ක්‍රීඩා සංගමය/සම්මේලනය අනුයුක්තව සිටින අන්තර්ජාතික ක්‍රීඩා සංවිධානය විසින් හෝ පනවන ලද තහනමකට, අත්හිටුවීමකට හෝ අවලංගු කිරීමකට භාජනය වී ඒ කාල සීමාව ගත කරමින් සිටී නම් හෝ නාමයෝජනා ඉදිරිපත් කරන දිනට එකී තහනමේ, අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ කාල සීමාව අවසන් කොට වසර දෙකක කාල සීමාවක් ඉකුත් වී නැත්නම්;

(ට) නාමයෝජනා ඉදිරිපත් කිරීමට වසර හතරක කාල පරිච්ඡේදය තුළදී, උත්තේජක ද්‍රව්‍ය භාවිතය, දූෂණය, ඔට්ටු ඇල්ලීම සහ අභ්‍යන්තර තොරතුරු අවභාවිතය සම්බන්ධ වරදක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව එකී ජාතික ක්‍රීඩා සංගමයක/සම්මේලනයක උත්තේජක මර්දන හෝ දූෂණ මර්දන විනිශ්චය සභාවකින් හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් හෝ අන්තර්ජාතික ක්‍රීඩා සංවිධානය විසින් හෝ ජාතික සංගමය අනුබද්ධ වී ඇති සම්මේලනය විසින් හෝ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් හෝ පනවන ලද දඬුවමකට යටත් වී සිටී නම් හෝ එකී ජාතික ක්‍රීඩා සංගමය/සම්මේලනය විසින් හෝ අන්තර්ජාතික සංවිධාන හෝ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් හෝ පනවන ලද තහනමකට, අත්හිටුවීමකට හෝ අවලංගු කිරීමකට හෝ යටත්ව සිටී නම්;

(ඩ) ක්‍රීඩා අමාත්‍යවරයාගේ අනුමැතිය හෝ එකඟත්වය ඇතිව ක්‍රීඩා සම්බන්ධ කාර්යයක් සඳහා ජාත්‍යන්තර ක්‍රීඩා උත්සවයක දී රට නියෝජනය කළ පුද්ගලයකු ලෙස නියමිත කාල සීමාව තුළ දී නැවත ශ්‍රී ලංකාවට නොපැමිණි තැනැත්තකු නම්;

(ණ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක තේරී පත් වූ හෝ නම් කරන ලද මන්ත්‍රීවරයෙකු වන්නේ නම්;

(ත) එම ජාතික ක්‍රීඩා සංගමයේ/සම්මේලනයේ නිලවරණය කමිටුවේ සාමාජිකයෙකු වීම;

(ද)

(i) නිශ්චිතව දක්වා ඇති කාලසීමාව වන මූල්‍ය වර්ෂය අවසාන වී මාස 2ක් තුළ දී කමිටුව විසින් සහතික කරන ලද විගණිත මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අසමත් වූ හෝ එසේ කිරීම පැහැර හැර ඇති ජාතික ක්‍රීඩා සංගමයක/සම්මේලනයක සභාපති, ලේකම්, භාණ්ඩාගාරිකවරයකු හෝ චෙක්පත් අත්සන් කරනු ලබන නිලධාරියෙකු හෝ වෙනත් වගකීම් සහගත නිලධාරියෙකු වශයෙන් ධුරයක් දරා සිටි තැනැත්තකු ජාතික ක්‍රීඩා සංගමය/සම්මේලනය විසින් හෝ ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් හෝ ක්‍රීඩා අමාත්‍යාංශය විසින් හෝ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් හෝ පවත්වන ලද පරීක්‍ෂණයකින් වරදකරුවකු වන්නේ නම්;

(ii) විධිමත් කමිටුවක් විසින් සිදු කරන ලද පරීක්‍ෂණයක දී මූල්‍ය වර්ෂය අවසන් වී මාස 02ක් ඇතුළත හෝ නියමිත දිනට පසුව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද ගිණුම් වාර්තා සම්බන්ධයෙන් අයථා පරිහරණයක් හෝ මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් වරදකරුවකු වූ විධායක කමිටු සාමාජිකයෙකු වන්නේ නම්; විධිමත් කමිටුවක් යන්නෙන් අදහස් වන්නේ, ජාතික ක්‍රීඩා සංගමයේ/සම්මේලනයේ මහා සභා රැස්වීම මගින් හෝ විශේෂ මහා සභා රැස්වීමක් හෝ විධායක කමිටුවක් හෝ සංගමයේ විනය කමිටුවක් හෝ එසේත් නැතිනම් ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා හෝ ක්‍රීඩා අමාත්‍යාංශය හෝ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පත් කරන ලද කමිටුවකි;

(iii) එක් එක් මූල්‍ය වර්ෂය අවසන් වී මාස 02ක් ඇතුළත විධායක කමිටුව විසින් සහතික කරන ලද විගණිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ ජාතික ක්‍රීඩා සංගමයක/සම්මේලනයක සභාපති, ලේකම්, භාණ්ඩාගාරික හෝ වෙනත් චෙක්පත් අත්සන් කිරීමේ නිලධාරි තනතුරක් දරන අයෙකු සම්බන්ධයෙන් පරික්ෂණය පවත්වා වරදකරු තීරණය කරන තුරු එවැනි පුද්ගලයින්ට ඉදිරි මැතිවරණ වර්ෂයේ තනතුරු සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමට අවසර නැත.

(5) යම් ආකාරයකින් සෘජුව හෝ වක්‍රව යම් ප්‍රසම්පාදනයක් සම්බන්ධ බැඳීමක් ඇති කරන ජාතික ක්‍රීඩා සංගමයක/සම්මේලනයක කමිටුවේ සෑම ධූර දරන්නකු ම වාර්ෂික පදනමක් මත සිය බැඳීමේ ස්වභාවය අනාවරණය කළ යුතු ය.

(6) එකී විධිවිධාන උල්ලංඝණය කිරීමක් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත. විධායක කමිටුවේ නිලධාරියෙකු මෙහි විධිවිධාන උල්ලංඝණය කරන බවට සෑහීමකට පත්වීමෙන් පසු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ජාතික ක්‍රීඩා සංගමයේ/සම්මේලනයේ එම නිලධාරියාට එරෙහිව පහත සඳහන් ආකාරයට සුදුසු පියවර ගත යුතුය;

(i) එම නිලධාරියා එවැනි ජාතික සංගමයෙන්/සම්මේලනයෙන් ඉවත් කිරීම, යම් පුද්ගලයෙක් ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලන එකකට වැඩි ගණනක නිලතල දරන්නේ නම්, එම නිලධාරියා එම සියලුම ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනවල කමිටුවලින් ඉවත් කිරීම;

(ii) එවැනි නිලධාරියෙකුය වසර තුනකට (3) නොඅඩු සහ වසර පහකට (5) නොවැඩි කාලයක් සඳහා කිසිදු ජාතික ක්‍රීඩා සංගමයක/සම්මේලනයක නිලතල දැරීමට තහනමක් පැනවීම;

(iii) ක්‍රීඩා නීතියට අනුව වැඩිමනත් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයාට නිර්දේශයක් කිරීම;

## **III** වන කොටස

### *ජාතික ක්‍රීඩා සංගම්වල/ සම්මේලනවල කාර්ය, බලතල සහ කර්තව්‍ය*

6. සෑම ජාතික ක්‍රීඩා සංගමයකටම/සම්මේලනයකටම පහත සඳහන් කාර්ය, බලතල සහ කර්තව්‍ය පැවතිය යුතුය.

(i) ශ්‍රී ලංකාවේ සෑම පළාතක ම සෑම මට්ටමකදීම අදාළ ක්‍රීඩාව සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ii) අදාළ ක්‍රීඩාව සඳහා ක්‍රීඩකයින්ගේ සහභාගීත්වය වැඩි දියුණු කිරීමේ අරමුණින් එම ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීමට සහ ජනප්‍රිය කිරීමට සහ ජාතික සහ අන්තර්ජාතික පිළිගැනීම සහ ශ්‍රේණිගත කිරීම සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම;

(iii) එකී ක්‍රීඩාවේ ප්‍රමිතිය ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ මට්ටමට ඉහළ නැංවීම;

(iv) ජාතික කණ්ඩායමේ කාර්යසාධන මට්ටම ඉහළ නැංවීම;

(v) එම ක්‍රීඩා සඳහා සහජ දක්ෂතා ඇති සෑම වයස් කාණ්ඩයක ම තැනැත්තන් හඳුනාගෙන සියලු මාර්ගයන්ගෙන් හා ආකාරයන්ගෙන් ඔවුන්ට උපකාර කිරීම;

(vi) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව විසින් අදාළ අන්තර්ජාතික ක්‍රීඩා සම්මේලන මගින් නිශ්චිතව දක්වන ලද තෝරාගැනීමේ නිර්ණායක නිසි ලෙස සැලකිල්ලට ගනිමින් ක්‍රීඩකයින් තෝරාගැනීම සඳහා සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ සම්බන්ධීකරණය වී ජාත්‍යන්තර හෝ කලාපීය ක්‍රීඩා ඉසව් නියෝජනය කිරීම සඳහා විනිවිදභාවයෙන් යුත් තේරීම් නිර්ණායකයක් සකස් කිරීම;

(vii) පරිපාලනයේ දී සහ මෙහෙයවීමේ දී විනිවිදභාවය සහතික කිරීම;

(viii) ක්‍රීඩකයන්ගේ හැකියාවන් හා නිපුණතාවන් වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් සැපයීම;

(ix) ක්‍රීඩකයන්ගේ ජීව දත්ත, සහභාගි වූ තරග අවස්ථා,ක්‍රීඩා,තරග,තරගාවලීන්,නියෝජනය කළ කණ්ඩායම්, ඔවුන්ගේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු සහ තේරීම්, ශ්‍රේණිගත කිරීම් හා වර්ගකිරීම් ලබා දී ඇති අවස්ථාවක දී එකී තේරීම්,ශ්‍රේණිගත කිරීම සහ වර්ගකිරීම්වලින් සමන්විත වන ක්‍රීඩක දත්ත සමුදායක් භාවිත කිරීම මගින් ඉහළ නිපුණතා සහිත මලල ක්‍රීඩකයන් හඳුනාගැනීමේ පද්ධති පවත්වාගෙන යාම;

(x) මූල්‍ය උපකාර ලබා ගැනීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළඹීම;

(xi) වර්තමාන අන්තර්ජාතික වර්ගීකරණ මට්ටම,කාල සීමාව තුළ අපේක්ෂිත ඉලක්ක සහ කාර්යසාධන මට්ටම වැඩිදියුණු කිරීමේ උපායමාර්ග ඇතුළත්ව වසර දහයක කාල සීමාවක් සඳහා සංයුක්ත සැලැස්ම සකස් කිරීම;

(xii) එළඹෙන වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සහ එකී ක්‍රියාකාරී සැලැස්ම පවත්නා වර්ෂය අවසන් වීමට මාස තුනකට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම;

(xiii) කමිටුව විසින් සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශනය එක් එක් මූල්‍ය වර්ෂය අවසන් වී මාස දෙකක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම;

(xiv) වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීම; සහ

(අ) ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ නිලවරණයෙන් විධායක කමිටුව පත් වූ වහාම විධායක සභාව මගින් තාක්ෂණික කමිටුවේ, මුදල් කමිටුවේ සහ විනය කමිටුවේ සාමාජිකයින් අවුරුදු හතරක (04) කාලයකට තෝරා පත් කර ගැනීම සඳහා සියලු සාමාජික අනුබද්ධ ආයතන දැනුවත් කර, නාමයෝජනා ලබා ගෙන සුදුසුකම් අනුව පත්කර ගැනීම.

(ආ) ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලනවල තේරීම් කමිටුව අවුරුදු දෙකක(02) කාල සීමාවකට පත් කිරීම සඳහා අදාළ ජාතික ක්‍රීඩා සංගමය/ සම්මේලනය තම ක්‍රීඩා සංගමයට/සම්මේලනයට අනුබද්ධ සියලුම සාමාජික ආයතන නිසි පරිදි දැනුවත්කොට නාම යෝජනා ලබාගෙන විධායක කමිටු රැස්වීමක් මගින් වඩා සුදුසු සාමාජිකයින් දස දෙනෙකු (10) තෝරා ගැනීම කළ යුතු අතර තෝරා ගන්නා ලද නාමයෝජනා ලේඛනය සහිත අයදුම්පත්‍ර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ද පිටපතක් සහිතව ජාතික තේරීම් කමිටුව වෙත යොමු කිරීම.ජාතික තේරීම් කමිටුව විසින් එම නාමයෝජනා පිළිබඳව තම නිර්දේශිත කමිටු නාමලේඛනය අමාත්‍යාංශ ලේකම් මගින් අනුමැතිය සඳහා විෂයභාර අමාත්‍යවරයා වෙත යොමු කිරීම.

යම් ජාතික සංගමයකට/ සම්මේලනයකට උක්ත නියෝග සමඟ අනුකූල වීමට නොහැකි වන අවස්ථාවක දී, ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව විසින් ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් නිදහස් කිරීමක් ඉල්ලා සිටිය හැකිය.

(ඇ) නිලවරණ කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සඳහා විශේෂ මහා සභා රැස්වීමක් පැවැත්වීම.

(xv) පෙර වර්ෂයේ/ වර්ෂයන්හි විගණකාධිපතිවරයා විසින් විගණිත මූල්‍ය ප්‍රකාශය/ ප්‍රකාශයන් සම්මත කිරීමට ඇත්නම් ඒවා ද සමග වාර්ෂික වාර්තාව සිය වාර්ෂික මහා සභා රැස්වීමේ දී හෝ විශේෂ මහා සභා රැස්වීමකදී සභා ගත කිරීම.

(xvi) සෑම වර්ෂයකම වාර්ෂික මහා සභා රැස්වීමෙන් පසු මාසයක් ඇතුළත පහත දැක්වෙන ලේඛන අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම :-

(අ) අවශ්‍ය අවස්ථාවල දී, එම ජාතික ක්‍රීඩා සංගමයට/ සම්මේලනයට තෝරා පත් කර ගනු ලබන ධුර දරන්නන්ගේ ජීව දත්ත;

(ආ) පැමිණීමේ ලේඛනයේ පිටපතක් ද සමඟ වාර්ෂික මහ සභා රැස්වීමේ වාර්තාවල සහතික කරන ලද පිටපතක්;

(ඇ) වාර්ෂික මහා සභා රැස්වීමේ දී ඉදිරිපත් කරන ලද මුදල් වර්ෂය සඳහා වන විගණිත මූල්‍ය ප්‍රකාශනයේ සහතික කරන ලද පිටපතක් සහ එකී විගණිත මූල්‍ය ප්‍රකාශනය වාර්ෂික මහා සභා රැස්වීමේ දී සම්මත කරනු ලැබ ඇති බවට සාක්ෂි;

(ඈ) එම වාර්ෂික මහා සභා රැස්වීමේ දී තෝරා පත් කර ගන්නා ලද නිලවරණ කමිටුවේ සාමාජිකයන්ගේ නම් සහ සන්නිවේදනය සඳහා වන තොරතුරු;

(ඉ) තරගාවලි සම්බන්ධ දින දර්ශන සහ දක්ෂතා හඳුනා ගැනීමේ වැඩසටහන ඇතුළුව සිය ව්‍යවස්ථාවේ දක්වනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා වන සංවර්ධන සැලැස්ම;

(ඊ) රජය විසින් ප්‍රදානය කරනු ලබන මූල්‍ය සහාය පිළිබඳ තොරතුරු සහ ඒවා පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහා වන ජාතික ක්‍රීඩා සංගමයේ ක්‍රියාකාරකම් පිළිබඳ ද්වි-වාර්ෂික ප්‍රගති වාර්තාවක්;

(xvii) නාමිකයන්ගේ නම් ලැයිස්තුව සමග වාර්ෂික මහ සභා රැස්වීමට පැමිණ ඡන්දය ප්‍රකාශ කිරීමේ හිමිකම ඇති සාමාජිකයන්ගේ ලැයිස්තුව ද,පෙර මුදල් වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනයේ සහතික කරන ලද පිටපතක් ද ඇතුළත් දැනුම්දීමක් වාර්ෂික මහා සභා රැස්වීමට අවම වශයෙන් දින 21කට (විසි එකකට) පෙර එහි අනුබද්ධ ආයතනවලට ඉදිරිපත් කිරීම;

(xviii) අදාළ ක්‍රීඩාවේ නියැලී ඇති අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජ සහ අනෙකුත් සංවිධාන ලියාපදිංචි කිරීම සහ මෙහි I වන උපලේඛනයේ දැක්වෙන ''ඈ'' ආකෘතියට සාරානුකූල විය යුතු ලේඛනයක් පවත්වා ගෙන යෑම;

(xix) එම අනුබද්ධ ආයතනයට, ක්‍රීඩා සමාජයට හෝ අනෙකුත් සංවිධානයට ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම;

(xx) (අ) ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ පහළම ඒකකය වන කලාපීය ක්‍රීඩා සමාජවල සිට දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් සහ පළාත් ක්‍රීඩා සංගම් දක්වා ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ අනෙකුත් ප්‍රධාන සාමාජික ක්‍රීඩා සමාජවල අධීක්ෂණ සහ නියාමන කටයුතු සඳහා පහසුකම් සැලසීමට ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා ඉදිරිපත් කිරීම;

(ආ) දිස්ත්‍රික් ක්‍රීඩා සංගමය තම බල ප්‍රදේශය තුළ අදාළ ක්‍රීඩාව ප්‍රවර්ධනය කරන්නේ ද, වාර්ෂිකව කලාපීය තරගාවලි 02කට නොඅඩු ප්‍රමාණයක් පවත්වන්නේ ද, ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කරන්නේද, ස්ථිර ක්‍රීඩක සංචිතයක් නඩත්තු කරන්නේ ද යන්න සහ දිස්ත්‍රික් සංගමය මගින් දේශීය ක්‍රීඩා සමාජ විධිමත් ලෙස අධීක්ෂණය හා නියාමනය කරන්නේ ද යන්න විමසා බැලීම සහ ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයාට වාර්තා කිරීම.

(ඇ) පළාත් ක්‍රීඩා සංගමය විසින් තම බල ප්‍රදේශය තුළ වාර්ෂිකව අන්තර් දිස්ත්‍රික් ක්‍රීඩා තරගාවලි 02 කට නොඅඩු ප්‍රමාණයක් පැවැත්වීම, ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීම සහ ස්ථිර පළාත් ක්‍රීඩා සංචිත පවත්වාගෙන යාම, බල ප්‍රදේශය තුළ අදාළ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම සහ පළාත් ක්‍රීඩා සංගම් විසින් දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් අධීක්ෂණය සහ නියාමනය කරන්නේද යන්න පිළිබඳ විස්තර ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කිරීම.

(xxi) අදාළ ජාතික ක්‍රීඩා සංගමයට/ සම්මේලනයට නීත්‍යානුකූලව සකස් කර ගත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයක් නොමැති අවස්ථාවල දී ප්‍රසම්පාදනය සහ ටෙන්ඩර් ප්‍රදානය සම්බන්ධයෙන් රජයේ සම්මත ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීම

(xxii) දේශීය හෝ විදේශීය වශයෙන් ලැබෙන යම් අරමුදල් ප්‍රසම්පාදනයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය විසින් හෝ ජාතික ප්‍රසම්පාදන කොමිසම විසින් නියම කරනු ලැබ ඇති ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීම;

(xxiii) යම් ක්‍රීඩා ඉසව්වක් පැවැත්වීම සඳහා අවශ්‍ය සියලු අරමුදල් කිසියම් ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් සතුව නැත්නම් ශ්‍රී ලංකාව තුළ කවර හෝ ක්‍රීඩා ඉසව්වක් පැවැත්වීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව ජාත්‍යන්තර සම්මේලනයක් සමග යම් ගිවිසුමකට එළඹීම;

(xxiv) ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ කමිටු රැස්වීම් සහ එකී රැස්වීම්වල දී සිදුවන ගනුදෙනු සම්බන්ධයෙන් ක්‍රියා පරිපාටිය නියාමනය සඳහා රීති සෑදීම;

(xxv) අවශ්‍ය අවස්ථාවල දී ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය නිලධරයන් සංඛ්‍යාව පත් කිරීම.

(xxvi) සෑම ජාතික ක්‍රීඩා සංගමයකටම / සම්මේලනයකටම ඔවුන්ගේ ක්‍රීඩාවට අදාළ විශේෂ අවශ්‍යතා ඇති (ශාරීරික ආබාධිත, දෘශ්‍යාබාධිත සහ ශ්‍රවණාබාධ ආදිය සහිත) පුද්ගලයන් ඇතුළත් වන අනුබද්ධ ක්‍රීඩා සංගම් අනුබද්ධ කර ගැනීමේ වගකීම ඇත.

(xxvii) ක්‍රීඩා සමාජ, ආයතන, දිස්ත්‍රික් ක්‍රීඩා සංගම්, පළාත් ක්‍රීඩා සංගම් හෝ දිස්ත්‍රික් හෝ පළාත් සංගමයකට අනුබද්ධ හෝ දිස්ත්‍රික් හෝ පළාත් ක්‍රීඩා සංගමයකට, ජාතික ක්‍රීඩා සංගමයකට / සම්මේලනයකට අනුබද්ධිත ක්‍රීඩා සමාජ සහ සාමාජික සංවිධානවල නිලවරණය ඇතුළු සියලුම ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර අදාළ ජාතික ක්‍රීඩා සංගමය / සම්මේලනය විසින් වාර්ෂිකව ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(xxviii) ජාතික ක්‍රීඩා සංගමය / සම්මේලනය ජාත්‍යන්තර ගිවිසුම්වලට සහ ජාත්‍යන්තර මූල්‍ය ගනුදෙනුවලට එළැඹෙන විට, එම ජාතික ක්‍රීඩා සංගමය/ සම්මේලනය රටේ මූල්‍ය විනය සහ අඛණ්ඩතාවට අනුකූලව මූල්‍ය, දූෂණ විරෝධී සහ මුදල් විශුද්ධිකරණයට එරෙහි නීතිවලට යටත්ව විනිවිදභාවයෙන් සහ ඒකාග්‍රතාවෙන් යුතුව ක්‍රියා කළ යුතුය.

7\. (i) සියලුම ජාතික ක්‍රීඩා සංගම් / සම්මේලනවල තේරීම් කමිටුව පත්කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලය ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවට පමණක් පැවරෙන අතර, තේරීම් පරීක්ෂණ පැවැත්වෙන දින, ස්ථාන, අදාළ විස්තර සහ තේරීම්

නිර්ණායක පිළිබඳ තොරතුරු දින 14 කට පෙර ක්‍රීඩකයින්ට දන්වා සිටිය යුතුය. එම සියලු විස්තරවල පිටපත් එදිනම ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවට ද ලිඛිතව ඉදිරිපත් කළ යුතුය. එවැනි තොරතුරු ඉදිරිපත් නොකරන ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලනවල තේරීම් පරීක්ෂණ සහ ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලනවල සභාපති/ ලේකම් සහ පුහුණුකරුවන්ගේ පෞද්ගලික අභිමතය පරිදි පැවැත්වෙන තේරීම් පරීක්ෂණ අවලංගු කිරීමට ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවට බලය ඇත.

(ii) සියලුම ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලන තේරීම් පරීක්ෂණ පැවැත්වීමට දින 28කට පෙර ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවට තේරීම් නිර්ණායක ඉදිරිපත් කළ යුතුය; සහ තේරීම් නිර්ණායක ඔවුන්ගේ නිල වෙබ් අඩවියේ සහ ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කළ යුතුය. එමෙන්ම තේරීම් පරීක්ෂණ අවසානයේ එහි ප්‍රතිඵල ඔවුන්ගේ නිල වෙබ් අඩවියේ පළ කර තෝරාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ නිවැරදි නාම ලේඛනය ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කළ යුතුය. මෙම තරගයේ ප්‍රතිඵල පිළිබඳ විරෝධතා ඇත්නම් ඒවා සෘජුවම ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය. විරෝධතා සලකා බැලීමෙන් අනතුරුව, සත්‍යාපිත ප්‍රතිඵල ලේඛනය සියලු විස්තර සමඟ ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනවල නිල වෙබ් අඩවියේ එදිනම ප්‍රකාශයට පත් කළ යුතුය.

(iii) තේරීම් පරීක්ෂණ සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයේ අදාළ ජාතික ක්‍රීඩාව භාර ව්‍යාපෘති නිලධාරියාගේ සහභාගීත්වය ලබා ගත යුතු අතර ඒ අනුව ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවට දැනුම් දිය යුතුය.

(iv) තේරීම් පරීක්ෂණ අවසානයේ, එම දිනයේම හෝ ඊට පසු දින ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව වෙත පහත සඳහන් තොරතුරු ලිඛිතව සැපයිය යුතුය:

(අ) ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ සභාපති හෝ ලේකම් විසින් සහතික කරන ලද තේරීම් පරීක්ෂණ සඳහා සහභාගී වූ තේරීම් කමිටු සාමාජිකයින්ගේ පැමිණීමේ පත්‍රිකාව.

(ආ) ජාතික ක්‍රීඩා සංගමයේ / සම්මේලනයේ තේරීම් කමිටු සාමාජිකයින් විසින් අත්සන් කරන ලද තේරීම් පරීක්ෂණ සඳහා සහභාගී වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ නම් ලැයිස්තුව.

(ඇ) ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ තේරීම් කමිටුව විසින් සහතික කරන ලද සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරා ගන්නා ආකාරය විස්තර කරන වාර්තාව සහ ඔවුන් සඳහා ලකුණු ප්‍රදානය කිරීමේ පත්‍රය.

(ඈ) සහභාගි වූ ඉසව් පිළිබඳ විස්තර, තෝරාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසින් අත්පත් කරගත් ස්ථාන සහ අතිරේක ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇතුළුව ඔවුන්ගේ නිවැරදි නම් ලැයිස්තුව.

(v) ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලනවල තේරීම් පරීක්ෂණ අවසානයේ ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවට ලැබෙන සියලුම අභියාචනා/ පැමිණිලි සම්බන්ධයෙන් විමසුම් / විමර්ශන පැවැත්වීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලය,මෙහි IV කොටසේ ඇතුළත් නියෝගවලට යටත්ව, ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව වෙත පැවරී ඇත.

(vi) සියලුම ජාතික ක්‍රීඩා සංගම් / සම්මේලනවල විධායක කමිටුවල සිදුවූ සාමාජික වෙනස්කම් පිළිබඳව ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවට ලිඛිතව දැනුම් දිය යුතුය.

(vii) ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව විසින් නිර්දේශ කරනු ලබන අදාළ ජාතික ක්‍රීඩා සංගම් / සම්මේලනවල තේරීම් කමිටු වෙත පත්වීම් ලිපි ලබා දීමේදී එහි පිටපතක් ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව වෙත ලබා දිය යුතුය.

(viii) ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව විසින් සියලුම ජාතික සංචිතවල ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ විස්තර පිළිබඳ දත්ත ගබඩාවක් සකස් කර යාවත්කාලීන කර පවත්වා ගෙන යා යුතුය. ඒ සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා සංගම් / සම්මේලන සංචිතවල සිටින සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා සහ ජීව දත්ත පිළිබඳ තොරතුරු ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව වෙත යොමු කළ යුතුය. ජාතික සංචිත නම් කිරීමෙන් පසු ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇතුළත් කිරීම / ඉවත් කිරීම පිළිබඳ තොරතුරු ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව වෙත ලබා දිය යුතුය.

(ix) ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට පෙර කිසිදු ජාත්‍යන්තර තරගාවලියක් සඳහා නාමයෝජනා ලබා නොදිය යුතු අතර එවැනි ජාත්‍යන්තර තරගාවලි සඳහා පුහුණුකරුවන්/ කළමනාකරුවන්/ සහාය පුහුණුකරුවන්/ ක්‍රීඩා පුහුණුකරුවන්/ සම්බාහකයන් නිර්දේශ කිරීමේදී සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු අතර පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවේ අනුමැතිය ලබා ගත යුතුය.

(අ) මේ දක්වා ක්‍රීඩා ක්ෂේත්‍රයට ලැබුණු දායකත්වය,

(ආ) ක්‍රීඩා ක්ෂේත්‍රයේ ඔවුන්ගේ වර්තමාන කාර්ය සාධනය,

(ඇ) අදාළ ක්‍රීඩාවේ දැනුම, අවබෝධය සහ පළපුරුද්ද,

(ඈ) ක්‍රීඩකයෙකු / පුහුණුකරුවෙකු ලෙස පෙන්නුම් කරන කුසලතා

## IV වන කොටස

*ජාතික ක්‍රීඩා සංගමයේ / සම්මේලනයේ තීරණ හෝ ක්‍රියාමාර්ගවලට එරෙහිව අභියාචනා කිරීමේ ක්‍රියා පටිපාටිය*

**ඔම්බුඩ්ස්මන්වරයා**

8.(1) ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා ජාතික ක්‍රීඩා සභාවේ අදහස් විමසා, සුදුසු පුද්ගලයෙකු ක්‍රීඩා ඔම්බුඩ්ස්මන්වරයා ලෙස පත් කළ යුතුය. එම ඔම්බුඩ්ස්මන්වරයා ශ්‍රී ලංකා පරිපාලන සේවය (SLAS) (I) ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ විශ්‍රාමික නිලධාරියෙකු විය යුතුය. ඔම්බුඩ්ස්මන්වරයා ලෙස පත් කරනු ලබන තැනැත්තෙකු වසර තුනක කාලයක් ධුරය දරනු ලබන අතර තවත් වසර තුනක කාලයක් සඳහා නැවත පත්කිරීම සඳහා සුදුසුකම් ලබයි. කිසිදු තැනැත්තෙකු වසර හයකට වැඩි කාලයක් ඔම්බුඩ්ස්මන් තනතුර නොදැරිය යුතුය.

(2) ක්‍රීඩා ඔම්බුඩ්ස්මන්වරයාගේ රාජකාරිය වන්නේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගමයක/ සම්මේලනයක යම් තීරණයකින් හෝ ක්‍රියාවකින් අගතියට පත් ඕනෑම තැනැත්තෙකු සම්බන්ධයෙන් ස්වාධීන සහ අපක්ෂපාතී පරීක්ෂණයක් පැවැත්වීමයි. අගතියට පත් පුද්ගලයා එවැනි තීරණයකින් හෝ ක්‍රියාවකින් දින 14ක කාලයක් ඇතුළත ක්‍රීඩා ඔම්බුඩ්ස්මන් වෙත ලිඛිතව ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය. සාධාරණ හා අපක්ෂපාතී සමාලෝචනයකින් පසුව, ක්‍රීඩා ඔම්බුඩ්ස්මන්වරයා විසින් එම ඉල්ලීම ලැබී දින 14ක් ඇතුළත ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් හරහා ක්‍රීඩා අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

(3) ඔම්බුඩ්ස්මන්වරයාගේ පාරිශ්‍රමිකය ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අදහස් විමසා තීරණය කරනු ලබන අතර ජාතික ක්‍රීඩා අරමුදල හරහා ගෙවනු ලැබේ.

(4) ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගමයක/ සම්මේලනයක තීරණයක් හෝ ක්‍රියාවකට අදාළ යම් ආරවුලක් ඔම්බුඩ්ස්මන් වෙත යොමු කිරීම, ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගමයක/ සම්මේලනයක තීරණයකට හෝ ක්‍රියාවකට අදාළව අභියාචනා උපදේශක කමිටුව වෙත කෙරෙන ඕනෑම අභියාචනයක් සඳහා පූර්ව කොන්දේසියක් විය යුතුය. ඔම්බුඩ්ස්මන්වරයා විසින් නිර්දේශයක් කරන තුරු, එවැනි අභියාචනයක් අභියාචනා උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුවන කාල සීමාව අදාළ නොවේ.

(5) විෂයභාර අමාත්‍යවරයා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා ක්‍රීඩා ඔම්බුඩ්ස්මන්වරයාගේ නිර්දේශවලට බැඳී නොසිටී.

(6) සෑම ජාතික ක්‍රීඩා සංගමයක් / සම්මේලනයක්ම ඔම්බුඩ්ස්මන්වරයාගේ සම්බන්ධීකරණ තොරතුරු සමඟ ඔම්බුඩ්ස්මන්වරයාගේ සේවය ලබා ගත හැකි බව එහි සාමාජිකයින්ට සහ ක්‍රීඩකයින්ට වාර්ෂිකව දැනුවත් කළ යුතුය.

**අභියාචනා උපදේශක කමිටුව**

9. (1) ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරයෙකුගේ ප්‍රධානත්වයෙන් සාමාජිකයින් 10 දෙනෙකුගෙන් සමන්විත අභියාචනා උපදේශක කමිටුවක් පත් කළ යුතුය. අභියාචනා උපදේශක කමිටුවක සාමාජිකයන් වසර තුනක (3) කාලයක් නිලතල දරනු ලබන අතර තවත් වසර තුනක (3) කාලයක් සඳහා නැවත පත් කිරීම සඳහා සුදුසුකම් ලැබිය හැකිය. කිසිදු තැනැත්තෙකු අභියාචනා උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස වසර හයකට (6) වැඩි කාලයක් තනතුරු නොදැරිය යුතුය.

(2) අමාත්‍යවරයා විසින් අභියාචනා උපදේශක කමිටුවක් සඳහා ලේකම්වරයෙකු පත් කළ යුතුය. එම ලේකම්වරයා වසර තුනක (3) කාලයක් සඳහා ධුරය දරන අතර තවත් වසර තුනක (3) කාලයක් සඳහා පත් කළ හැකිය. කිසිදු තැනැත්තෙකු අභියාචනා උපදේශක කමිටුවේ ලේකම් ලෙස වසර හයකට (6) වැඩි කාලයක් නිලතල නොදැරිය යුතුය.

(3) අභියාචනා උපදේශක කමිටුවේ සාමාජිකයින්ගේ සහ අභියාචනා උපදේශක කමිටුවේ ලේකම්වරයාගේ පාරිශ්‍රමිකය ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අදහස් විමසා තීරණය කර ජාතික ක්‍රීඩා අරමුදල හරහා ගෙවිය යුතුය.

(4) ඔම්බුඩ්ස්මන්වරයාගේ නිර්දේශවලින් අගතියට පත් ඕනෑම තැනැත්තෙකුට ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් හරහා අභියාචනා උපදේශක කමිටුව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. අභියාචනා උපදේශක කමිටුව වෙත කරන ඕනෑම අභියාචනයක් ක්‍රීඩා නීතියේ 30 වැනි වගන්තියේ දක්වා ඇති පරිදි අමාත්‍යවරයාට කරන ලද අභියාචනයකට සමාන බලපෑමක් ඇති කරනු ලැබේ.

(5) එවැනි අභියාචනයක් ඔම්බුඩ්ස්මන්වරයාගේ නිර්දේශ / නිර්දේශයන් ලබා දුන් දින සිට දින 14ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය.

(6) එකී අභියාචනය සනාථ කිරීම සඳහා අදාළ සියලු සාක්ෂි හා අනෙකුත් අවශ්‍ය කරුණු ද අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවන ලද ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පනස් දහසක් (රු. 50,000/-) A ශ්‍රේණියේ ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් සඳහා ද, රුපියල් විසි පන්දහසක් (රු. 25,000/-) B ශ්‍රේණියේ ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් සඳහා ද, රුපියල් පහළොස් දහසක් (රු. 15,000/-) C ශ්‍රේණියේ ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් සඳහා ද ලෙස වූ ආපසු නොගෙවනු ලබන මුදල ගෙවූ බවට වන ලදු පතේ මුල් පිටපත ද එම අභියාචනය සමග ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත පිටපත් හතරක් (04) සහිතව ඉදිරිපත් කළ යුතුය. අභියාචනා සඳහා ගෙවනු ලබන සියලු මුදල් ජාතික ක්‍රීඩා අරමුදල වෙත බැර කළ යුතුය. ක්‍රීඩකයෙකු විසින් ඔහුගේ හෝ ඇයගේ ක්‍රීඩක තේරීම් හෝ ක්‍රීඩක ගෙවීම් සම්බන්ධව කරනු ලබන ඕනෑම අභියාචනයක් කිසිදු ගෙවීමකින් නිදහස් කෙරේ.

(7) නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අභියාචනා, ගෙවීම් කරන ලද දින සිට දින 7ක් ඇතුළත ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් විසින් අභියාචනා උපදේශක කමිටුවේ ලේකම් වෙත යොමු කළ යුතුය. අභියාචනා උපදේශක කමිටුවේ ලේකම් තනතුරේ කිසියම් පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී, ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එම අභියාචනය, අභියාචනා උපදේශක කමිටුව වෙත සෘජුවම යොමු කළ යුතුය.

(8) අභියාචනා උපදේශක කමිටුව විසින් තමන්ට සුදුසු යැයි හැඟෙන පරිදි වැඩිදුර තොරතුරු ඉල්ලා සිටිය හැකි අතර, එම අභියාචනය ලැබී දින 14ක් ඇතුළත ඔවුන්ගේ නිර්දේශ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් හරහා ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා වෙත යොමු කළ යුතුය.

(9) විෂයභාර අමාත්‍යවරයා අභියාචනා උපදේශක කමිටුවේ නිර්දේශවලට බැඳී නොසිටී.

## V වන කොටස

### *නියෝග පරිච්ඡින්න කිරීම*

10. ක්‍රීඩා පනත ප්‍රකාරව ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද පහත නියෝග යටතේ නීත්‍යානුකූලව සිදු කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි එකී නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

2016 ඔක්තෝබර් 27 වැනි දින අංක 1990/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 අංක 1 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග

2017 පෙබරවාරි 13 වැනි දින අංක 2006/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2017 මැයි 05 වැනි දින අංක 2017/41 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2018 සැප්තැම්බර් 22 වැනි දින අංක 2089/56 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2018 ඔක්තෝබර් 18 වැනි දින අංක 2093/39 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2019 ජනවාරි 10 වැනි දින අංක 2105/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2019 ජුනි 18 වැනි දින අංක 2128/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2019 අගෝස්තු 23 වැනි දින අංක 2137/85 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2019 අගෝස්තු 23 වැනි දින අංක 2137/86 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2020 මාර්තු 10 වැනි දින අංක 2166/9 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2020 අප්‍රේල් 30 වැනි දින අංක 2173/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2020 මැයි 27 වැනි දින අංක 2177/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2020 ජූලි 31 වැනි දින අංක 2186/31 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2020 සැප්තැම්බර් 18 වැනි දින අංක 2193/55 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2020 සැප්තැම්බර් 21 වැනි දින අංක 2194/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2020 සැප්තැම්බර් 23 වැනි දින අංක 2194/54 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2020 නොවැම්බර් 19 වැනි දින අංක 2202/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2020 දෙසැම්බර් 23 වැනි දින අංක 2207/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2021 පෙබරවාරි 19 වැනි දින අංක 2215/47 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2021 ජූනි 01 වැනි දින අංක 2230/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2022 මාර්තු 23 වැනි දින අංක 2272/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2022 මැයි 26 වැනි දින අංක 2281/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2022 මැයි 27 වැනි දින අංක 2281/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2022 සැප්තැම්බර් 08 වැනි දින අංක 2296/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2022 සැප්තැම්බර් 17 වැනි දින අංක 2297/94 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2022 සැප්තැම්බර් 22 වැනි දින අංක 2298/50 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2022 නොවැම්බර් 05 වැනි දින අංක 2304/88 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2022 දෙසැම්බර් 14 වැනි දින අංක 2310/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2022 දෙසැම්බර් 14 වැනි දින අංක 2310/28 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2023 මැයි 08 වැනි දින අංක 2331/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2023 මැයි 31 වැනි දින අංක 2334/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2023 ජූලි 28 වැනි දින අංක 2342/48 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2023 අගෝස්තු 09 වැනි දින අංක 2344/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2023 අගෝස්තු 17 වැනි දින අංක 2345/65 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2023 සැප්තැම්බර් 25 වැනි දින අංක 2351/07 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2023 නොවැම්බර් 05 වැනි දින අංක 2356/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2024 ජනවාරි 13 වැනි දින අංක 2366/42 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

2024 ජනවාරි 24 වැනි දින අංක 2368/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

11. පරිච්ඡින්න කරන ලද නියෝග යටතේ ලියාපදිංචි කරන ලද සෑම ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් ම මේ නියෝග යටතේ ලියාපදිංචි කරන ලද ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් වශයෙන් සලකනු ලැබිය යුතුය.

## VI වන කොටස

### *අර්ථ නිරූපණය*

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම නියෝගවල -

"මලල ක්‍රීඩකයා" යන්නෙන්, අන්තර්ජාතික හෝ ජාතික මට්ටමේ යම් ක්‍රීඩාවක හෝ යම් ක්‍රීඩා ඉසව්වකට සහභාගී වන තැනැත්තකු අදහස් වේ;

"ඔට්ටු තැබීම"යන්නෙන් සහ ඒ සඳහා පහත දැක්වෙන ඒවා ද ඊට ඇතුළත් වේ :-

(අ) යම් ක්‍රීඩාවක,තරගයක හෝ ඉසව්වක ප්‍රතිඵලය,ප්‍රගතිය,එය පැවැත්වීම හෝ එහි වෙනත් යම් අංගයක් පිළිබඳව (තනි තනිව, සමූහ වශයෙන් හෝ වෙනත් ආකාරයකින්) වෙනත් යම් පාර්ශවයක් සමග ඔට්ටු තැබීම,පිළිගැනීම, දැමීම හෝ වෙනත් ආකාරයකින් ඔට්ටු ඇල්ලීම;

(ආ) යම් තරගයක හෝ ඉසව්වක හෝ ක්‍රීඩාවක ප්‍රතිඵලය, ප්‍රගතිය, එය පැවැත්වීම හෝ එහි වෙනත් යම් අංගයක් පිළිබඳව ඔට්ටුවකට එළඹීම සඳහා වෙනත් යම් පාර්ශවයකින් ඉල්ලා සිටීම, පෙළඹවීම, කැමති කරවා ගැනීම, උපදෙස් ලබා දීම, නම්මා ගැනීම, දිරි ගැන්වීම, පහසුකම් සැලසීම හෝ බලය ලබා දීම;

(ඇ) ක්‍රීඩකයාගේ දැනුම අනුව යම් සිදුවීමක් ඔට්ටුවකට විෂයය වී තිබීම සහ ඒ සඳහා ඔහු යම් ප්‍රසාදයක් ලැබීමට අපේක්ෂා කරන හෝ ලබා ගෙන ඇති යම් සිදුවීමක් තරගයක දී හෝ ඉසව්වක දී හෝ ක්‍රීඩාවක දී සිදු වීම සහතික කිරීම;

"දූෂණය" යන්නෙන්, යම් තරගයක හෝ ඉසව්වක ප්‍රතිඵලය, ප්‍රගතිය සහ එය පැවැත්වීම කෙරෙහි හෝ එහි වෙනත් අංගයක් පිළිබඳව අයුතු සහගත ලෙස බලපාන පරිදි යම් ආකාරයකින් හෝ වෙනත් ආකාරයකින් සැලසුම් කිරීම හෝ උපක්‍රම යෙදීම හෝ එසේ අයුතු සහගත ලෙස බලපාන පරිදි යම් ආකාරයකට හෝ වෙනත් ආකාරයකට සැලසුම් කිරීමේ හෝ උපක්‍රම යෙදීම් පාර්ශවකරුවකු වීම අදහස් වේ;

"උත්තේජන භාවිතය" යන්නෙන් 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත හෝ එහි යම් සංශෝධනයක් ප්‍රකාර ඕනෑම වරදක් අදහස් වේ;

"ප්‍රධාන ක්‍රීඩා තරගාවලිය" "ක්‍රීඩා තරගය" හෝ "තරගය" යන්නෙන්, ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් විසින් ඒ සම්බන්ධයෙන් කරනු ලබන නිර්දේශයන් අනුව අමාත්‍යවරයා විසින් කලින් කලට අනුමත කරනු ලැබිය හැකි තරගාවලියක්, ක්‍රීඩා තරගයක් හෝ තරගයක් අදහස් වේ;

"ජාතික ක්‍රීඩා සංගමය/ සම්මේලනය"යන්නෙන්,ක්‍රීඩා පනතේ දැක්වෙන අර්ථය ම අදහස් වන අතර එම ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ සාමාජිකයන් සහ අනුබද්ධ ආයතන ඇතුළත් විය යුත්තේ ය;

"ක්‍රීඩා පනත" යන්නෙන් 1973 අංක 25 දරන ක්‍රීඩා පනත හෝ එහි යම් සංශෝධනයක් අදහස් වේ.

ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත යන්නෙන් 2019 අංක 24 දරන පනත අදහස් වේ.

(2 වන නියෝගය)

## I වන උපලේඛනය

*'අ' ආකෘති පත්‍රය*

**ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය**

1. ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ නම :..................................................................................

2. ලිපිනය :.....................................................................................................................

3. ජාතික ක්‍රීඩා සංගමය/ සම්මේලනය පිහිටු වූ දිනය : ......................................

4. ක්‍රීඩා හෝ ක්‍රීඩා කාණ්ඩවල නම : ....................

5. පහත දැක්වෙන ලේඛන මේ ඉල්ලුම්පත්‍රයට අමුණා ඇත :

   (අ) මෙහි III වන උපලේඛනයේ දැක්වෙන කාරණා මාර්ගෝපදේශ වශයෙන් ඇතුළත් වන එකී සංගමයේ ව්‍යවස්ථාවේ සහතික කරන ලද පිටපතක් : ඔව්/ නැත

   (ආ) එකී සංගමයේ නම, කාර්යාලයීය ලිපිනය සහ සන්නිවේදනය සඳහා වන තොරතුරු සහ එකී ජාතික සංගමයේ/ සම්මේලනයේ කමිටුවේ වර්තමාන ධුර දරන නිලධරයන්ගේ නම්, ලිපිනයන් සහ සන්නිවේදනය සඳහා වන තොරතුරු; ඔව්/ නැත

   (ඇ) එකී නිලධරයන් තෝරා පත් කර ගත් වාර්ෂික මහා සභා රැස්වීමේ වාර්තාවල සහතික කරන ලද පිටපතක් : ඔව්/නැත

   (ඈ) කලින් වර්ෂය සඳහා එකී ජාතික ක්‍රීඩා සංගමයේ විගණිත ගිණුම්වල සහතික කරන ලද පිටපතක් : ඔව්/නැත (අදාළ වේ නම්)

   (ඉ) එකී සංගමයේ අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජ සහ අනිකුත් සංවිධානවල සහ එකී අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජවල සහ අනෙකුත් සංවිධානවල කමිටු සාමාජිකයන්ගේ නම්, ලිපිනයන් සහ අනෙකුත් සන්නිවේදනය සඳහා වන තොරතුරු ඇතුළත් විස්තර : ඔව්/නැත

6. ඉහත සඳහන් කරන ලද කමිටුවේ වර්තමාන නිලධරයන් තෝරා පත් කර ගත් වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වූ දිනය : .. ......................................

ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමට විධිමත් ලෙස බලය පවරන .................................................................................................. (ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ නම) මහා සභා රැස්වීමේ දී සම්මත කර ගනු ලැබූ යෝජනාවක් අනුව ඉල්ලුම් කරනු ලැබේ.

(යෝජනා සම්මතයේ පිටපතක් සහ රැස්වීමේ වාර්තාවල පිටපතක් අමුණන්න)

ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ සභාපතිගේ අත්සනඃ

නම සහ ලිපිනයඃ

දිනයඃ

ලේකම්ගේ අත්සනඃ

නම සහ ලිපිනයඃ

ඉල්ලුම්කරන්නාගේ අත්සනඃ

(2 වන නියෝගය)

**'ආ' ආකෘති පත්‍රය**

***ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් ලියාපදිංචිය පිළිබඳ සහතිකය***

ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ නම :.........................................................................

20 .................. මස ......... දින සිට ක්‍රියාත්මක වන පරිදි ...............................................(ක්‍රීඩාවේ නම) පිළිබඳ ජාතික ක්‍රීඩා සංගමය/ සම්මේලනය වශයෙන් 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 29 වැනි වගන්තිය යටතේ .......................................................................... ලියාපදිංචි වී ඇති බව මෙයින් සහතික කරමි. සංගමය සඳහා ප්‍රදානය කරන ලද ලියාපදිංචි කිරීමේ අංකය ............................................. වේ.

.....................................
ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්

දිනයඃ...........................

(2 වන නියෝගය)

**'ඇ' ආකෘති පත්‍රය**

***ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලන ලේඛනය***

1. ක්‍රීඩාවල හෝ ක්‍රීඩා කාණ්ඩවල නම ඃ...................................................................................................

2. ක්‍රීඩා නීතියේ 28 වන වගන්තිය යටතේ නියමය පිළිබඳ විස්තර ඃ...............................................................

    (1) ගැසට් පත්‍රයේ දිනය/ අංකය ඃ............................................................

    (2) ක්‍රීඩා අමාත්‍යාංශයේ/ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලිපිගොනු අංකය ඃ.....................................

3. ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් වශයෙන් පළමු ලියාපදිංචිවීමේ දිනය ..................................

4. සංගමයේ සහ ධූරදරන්නන්ගේ ලිපිනයන් සහ සන්නිවේදනය සඳහා තොරතුරු ඃ...........................................

5. ලියාපදිංචිය කලින් අවලංගු කිරීම/ අත්හිටුවීම් සිදුවී ඇත්නම් අවලංගු කළ/ අත්හිටුවන ලද දිනය ඃ ................................

6. අතුරු කමිටුව (තිබේ නම් සහ කාල සීමාව) ඃ..................................................

7. වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වූයේ ද? ඔව්/ නැත      දිනය ඃ................................

8. වාර්ෂික ගිණුම් විගණකාධිපති විසින් විගණනය කරන ලදී ඃ ඔව්/ නැත

9. ව්‍යවස්ථාව අධ්‍යක්ෂ ජනරාල් විසින් ලියාපදිංචි කරන ලදී ඃ ඔව්/ නැත ...........දිනය ඃ..........................

10. පවත්වන ලද ජාතික ක්‍රීඩා තරගාවලීන් ඃ ...........................................................

(7 වන නියෝගය)

**'ඈ' ආකෘති පත්‍රය**

***අ කොටස***

**ජාතික ක්‍රීඩා සංගම්වලට/ සම්මේලනවලට සෘජුවම අනුයුක්ත වී ඇති සාමාජික ලේඛනය**

1. ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ නම :--.................................................................

2. අනුබද්ධ ආයතනයේ නම :-...............................................................................................

3. ලිපිනය :- ...........................................................................................................................

4. සාමාජික සංඛ්‍යාව :- ........................................................................................................

5. වාර්ෂික මහා සභා රැස්වීම්වලට සහභාගී වීම සඳහා අවසර ලබා දී ඇති නියෝජිතයන් සංඛ්‍යාව :-....................................................... ........................................................................................................

6. වාර්ෂික මහා සභා රැස්වීම්වල දී සාමාජිකයන් සඳහා අවසර ලබා දී ඇති ඡන්ද සංඛ්‍යාව :-...................................................................... ...................................................................................

7. සාමාජිකයන්ගේ නම්:-.........................................................................................................

8. නිලධරයන්ගේ ධූරයන්ගේ නාමය සහිතව නම් සහ ලිපිනයන් :-.........................................................

9. කමිටු සාමාජිකයන්ගේ නම් සහ ලිපිනයන් :-.....................................................

**ආ කොටස**

***පළාත් සංගම්, දිස්ත්‍රික් සංගම්, ඒකාබද්ධ සංගම්, ලීගවල හෝ ජාතික ක්‍රීඩා සංගම්වලට/ සම්මේලනවලට අනුබද්ධ වෙනත් යම් සංවිධානවල සාමාජිකයන්ගේ ලේඛනය***

1. පළාත් සංගමයේ, දිස්ත්‍රික් සංගමයේ, ඒකාබද්ධ සංගමයේ, ලීගයේ හෝ වෙනත් යම් සංවිධානයක නම :- .......................................... ................................

2. ලිපිනය :-.........................................................

3. අනුබද්ධ ආයතනයේ නම :-................................

4. ලිපිනය :-.........................................................

5. සාමාජික සංඛ්‍යාව :-......................................

6. ධූර නාමය සහිතව ධූර නිලධරයන්ගේ නම් සහ ලිපිනයන් :-...............................

7. කමිටු සාමාජිකයන්ගේ නම් සහ ලිපිනයන් :-............................

(2 වන නියෝගය)

## II වන උපලේඛනය

### *ක්‍රීඩාවල නම්*

1. බැඩ්මින්ටන්
2. ජල ක්‍රීඩා
3. කාය වර්ධන
4. පාපැදි
5. රයිෆල්
6. හොකී
7. කරාතේ දෝ
8. රුවල් ඔරු
9. රග්බි
10. බර ඉසිලීම
11. ජිම්නාස්ටික්
12. ගොල්ෆ්
13. මල්ලව පොර
14. මෝටර් රථ ක්‍රීඩා
15. පැසි පන්දු
16. මලල ක්‍රීඩා
17. ක්‍රිකට්
18. දැල් පන්දු
19. ටෙනිස්
20. බ්‍රිජ්
21. කැරම්
22. ජීවිතාරක්ෂක
23. බොක්ෂිං
24. ජූඩෝ
25. බිලියඩ් හා ස්නූකර්
26. පාපන්දු
27. වොලිබෝල්
28. එල්ලේ
29. චෙස්
30. ඔරු පැදීම
31. මේස පන්දු
32. ස්කොෂ්
33. ටයිකොන්ඩෝ
34. සැහැල්ලු පන්දු ක්‍රිකට්
35. සවිඑසවීම
36. කබඩි
37. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ක්‍රීඩා (පැරාලිම්පික්)
38. මෝටර් සයිකල් ක්‍රීඩා
39. බේස් බෝල්
40. වූෂු
41. ත්‍රෝ බෝල්
42. දුනු විදීම
43. අශ්වාරෝහක
44. සාම්ප්‍රදායික කරාතේ
45. අත් පන්දු
46. කඹ ඇදීම
47. වෙඩි තැබීම
48. ෆෙන්සින් (කඩු හරඹ)

49. රෝද සපත්තු
50. සෙපැක්ටැක්රෝ
51. සුමෝ
52. මොඩර්න් පෙන්ටැත්ලෝන්
53. ජුජිට්සු
54. සැම්බෝ
55. කෝ කෝ
56. අංගම්පොර
57. කුදෝ
58. බෝල්රූම් ඩාන්සින්
59. රෝල් බෝල්
60. කඳු නැගීම
61. කැනොයින් සහ කායකින්
62. ස්ක්‍රැබල්
63. මුයි තායි
64. යුනිෆයිට්
65. පවර්බෝට්
66. සර්ෆින්
67. බෝල් බැඩ්මින්ටන්
68. ප්‍රංශ සවාට්
69. ලෝන් බෝල්
70. ඊ ස්පෝර්ට්ස්
71. ටෙක්බෝල්
72. ජීට් කුන් ඩෝ
73. කෝෆ්බෝල්

(2, 3 සහ 5 වන නියෝග)

## III වන උපලේඛනය

### *ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලනවල ව්‍යවස්ථාවට අදාළවන කරුණු*

සෑම ජාතික ක්‍රීඩා සංගමයක්/ සම්මේලනයක් සතුව පහත දැක්වෙන විස්තර ඇතුළත් ව්‍යවස්ථාවක් තිබිය යුතුය ෑ

(අ) අදාළ ජාතික ක්‍රීඩා සංගමය/ සම්මේලනය විසින් සෑම වසරකම මූල්‍ය වර්ෂය අවසන් වීමට මාස තුනකට පෙර හෝ එදින විගණිත ගිණුම් සමඟ වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්වීම;

(ආ) ව්‍යවස්ථාවට අනුකූලව සහ නිදහස් හා සාධාරණ ලෙස ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ කමිටු නිලධාරීන් තෝරා පත් කර ගැනීම සඳහා නිලවරණය පැවැත්වීම;

(ඇ) තම අනුබද්ධ ආයතනවල,ක්‍රීඩා සමාජවල සහ අනෙකුත් සංවිධානවල ඡන්ද අයිතිය හා නියෝජනය කරන ආකාරය;

(ඈ) තමන්ගේ අදාළ අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජ සහ අනෙකුත් සංවිධාන විසින් දෙනු ලබන නිල නියෝග ප්‍රකාරව ක්‍රියාවේ යෙදවිය යුතු ඡන්දය දීමේ හිමිකම අදාළ අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජ සහ අනෙකුත් සංවිධානවලට ලබා දීම;

(ඉ) අදාළ දිස්ත්‍රික්කය තුළ අදාළ අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමේ වගකීම පැවරෙන පළාත් හෝ දිස්ත්‍රික් නිලධරයන් පත් කිරීම සහ ජාතික ක්‍රීඩා සංගමයට/ සම්මේලනයට ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීම;

(ඊ) අදාළ අනුබද්ධ පාසල් සංගම් මගින් නම් කිරීම මත, නියෝජිතයන් දෙදෙනෙකුට නොවැඩි අනුබද්ධ පාසල් සංගම් සංඛ්‍යාවක් එකී ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ තීරණ ගැනීමේ කමිටුවට පත් කිරීම සහ පත් කරනු ලබන්නාට ඡන්ද හිමිකම තිබේදැයි නිගමනය කිරීම සඳහා එකී ජාතික ක්‍රීඩා සංගමයට/ සම්මේලනයට හැකියාව ලබා දීම;

(උ) අවම වශයෙන් මසකට වරක්වත් ජාතික ක්‍රීඩා සංගම්වල/ සම්මේලනවල කමිටු රැස්වීම් පැවැත්වීම හා අවම වශයෙන් පාසල් සංගම්වල නියෝජිතයන් එක් අයෙකුවත් එවැනි රැස්වීම්වලට සහභාගී විය යුතු බව;

(ඌ) ජාතික ක්‍රීඩා සංගමයක/ සම්මේලනයක වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳව සිය අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජ සහ අනෙකුත් සංවිධානවලට දින හතළිහකට නොඅඩු වන දැනුම් දීමක් ලිඛිතව ලබා දීම;

(එ) වාර්ෂික මහා සභා රැස්වීමට අඩු වශයෙන් දින විසි එකකට පෙර, වාර්ෂික වාර්තාව සහ විගණකාධිපතිවරයා විසින් සහතික කරන ලද පෙර මුදල් වර්ෂයට අදාළ විගණිත මූල්‍ය ප්‍රකාශනයේ පිටපතක් ලබා දීම;

(ඒ) එක් එක් පුද්ගලයාට ප්‍රකාශ කිරීමට අයිතිය ඇති ඡන්ද සංඛ්‍යාව විශේෂිතව දක්වමින්, එවැනි වාර්ෂික මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් ඇති සාමාජික ලැයිස්තුවක් සිය සාමාජික අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජ සහ අනෙකුත් සංවිධානවලට වාර්ෂික මහා සභා රැස්වීමට අඩු වශයෙන් දින විසි එකකටවත් කලින් ලබා දීම;

(ඔ) සහභාගී විය යුතු තරගාවලීන්, තරග හෝ ක්‍රීඩාවලට සහභාගී වී නැති යම් සාමාජික අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජ සහ අනෙකුත් සංවිධානවලට යම් කාල සීමාවක් තුළ ඡන්ද අයිතිය අහිමි කිරීම සහ නව සාමාජිකයන් වශයෙන් පිළිගනු ලබන රැස්වීමේ දී නව සාමාජිකයන්ට ඡන්ද අයිතිය ලබා නොදීම;

(ඕ) ජාතික ක්‍රීඩා සංගමයක/ සම්මේලනයක නව කමිටුව පත් කිරීමට පෙර පැවති කමිටුවේ සිටි නිලධරයන් විසින් එකී සංගමයට අදාළ කරුණු සම්බන්ධ සියලු ලේඛන, මුරපද, බැංකු ගිණුම් විස්තර සහ ඉලෙක්ට්‍රොනික දත්ත එකී නව කමිටුව පත් වූ දිනයේ සිට දින හතක් ඇතුළත එම නව කමිටුව සඳහා පත්වුණු නිලධරයන් වෙත භාර දීම අනිවාර්ය කිරීම;

(ක) නිලවරණ කමිටුවේ, තීරණ ගැනීමේ කමිටුවේ, තේරීම් කමිටුවේ, වර්ගීකරණ කමිටුවේ හෝ ශ්‍රේණිගත කිරීමේ කමිටුවේ, තාක්ෂණික කමිටුවේ, මුදල් කමිටුවේ සහ විනය කමිටුවේ නිලධරයන් පත් කිරීමේ නිලවරණය, ඉවත් කිරීම, නිලධරයන්ගේ සුදුසුකම්, සංයුතිය, කාල සීමාව සහ වගකීම් පිළිබඳ ක්‍රියාපටිපාටිය විශේෂිතව දැක්වීම;

(ග) වාර්ෂික මහා සභා රැස්වීමේ දී සිය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජ හෝ වෙනත් සංවිධාන විසින් නම් කරනු ලබන තැනැත්තන්ගේ නම්, වාර්ෂික මහා සභා රැස්වීමට/ නිලවරණයට අඩු වශයෙන් දින විසි එකකට පෙර ජාතික සංගමයට/ සම්මේලනයට දැනුම් දිය යුතු බවට විධිවිධාන සැලසීම;

(ච) ගණපූරණයක් නොමැති වීම නිසා ජාතික ක්‍රීඩා සංගමයක/ සම්මේලනයක වාර්ෂික මහා සභා රැස්වීම කල් දමනු ලබන අවස්ථාවක දී එම න්‍යාය පත්‍රය සඳහා ම රැස්වීම නැවත කැඳවන ලෙසට දින දහහතරකට පෙර ලිඛිත දැන්වීමක් කළ යුතු බවට වන ක්‍රියාපටිපාටිය;

(ජ) සාමාජික අනුබද්ධ සංගම්, ක්‍රීඩා සමාජ සහ අනෙකුත් සංවිධානවල ගිණුම් පොත් නිසි පරිදි පවත්වාගෙන යෑම අනිවාර්ය කිරීම;

(ට) සාමාජික අනුබද්ධ සංගම්, ක්‍රීඩා සමාජ සහ අනෙකුත් සංවිධාන වාර්ෂික මහා සභා රැස්වීම, විධිමත් නිලවරණ සහ ගිණුම් පවත්වාගෙන යෑමට අසමත් වන්නේ නම්, වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී වීම සහ ඡන්දය ප්‍රකාශ කිරීම සහ ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ නිලවරණයේ දී ඡන්දය ප්‍රකාශ කිරීම අහිමි වන බව සඳහන් කිරීම;

(ඩ) යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු සහ ක්‍රීඩා සංවිධානයේ පසුබිමක් ඇති තැනැත්තකු නොවන්නේ නම්,ඔහු ජාතික ක්‍රීඩා සංගමයක/ සම්මේලනයක නියෝජිතයෙකු හෝ අභි නියෝජිතයෙකු වශයෙන් එයට අදාළ අන්තර්ජාතික ඒකාබද්ධ සංගමයට හෝ වෙනත් අන්තර්ජාතික සම්මේලනයකට පත් නොකරන බවට සහතික වීම;

(ණ) ජාතික ක්‍රීඩා සංගම් විසින් පුහුණුකරුවන්, තරග තීරකයන්, සහ ක්‍රීඩා විනිසුරුවන් පත් කිරීමේ සහ එබඳු පුහුණුකරුවන්, තරග තීරකයින්, සහ විනිසුරුවන් කළමනාකරණය හා අධීක්ෂණය කිරීමේ පටිපාටිය නියම කිරීම;

(ත) අදාළ අන්තර්ජාතික ඒකාබද්ධ සංගම්වල නිශ්චිතව දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූලව සිය ක්‍රීඩකයන්, සාමාජිකයන්, පුහුණුකරුවන්, තීරකයන්, විනිසුරුවන් සහ අනෙකුත් සියළු නිලධාරීන් සම්බන්ධයෙන් චර්යා ධර්ම පද්ධතියක් සකස් කිරීම;

(ද) ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජ සහ අනෙකුත් සංවිධානවල වගකීම් විශේෂිතව දැක්වීම;

(න) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතන නීති සංග්‍රහය සහ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නීති සංග්‍රහයට අනුකූල වීම;

(ප) ක්‍රීඩක කමිටුවක් පත් කිරීම සහ ජාත්‍යන්තර ක්‍රීඩා සංවිධානවල ව්‍යවස්ථාවට අනුකූලව ක්‍රීඩක නියෝජිතයින් ඒවායේ පාලක මණ්ඩලවලට ඇතුළත් කිරීම;

(බ) එක් එක් ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ අදාළ ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ වාර්ෂික මහා සභා රැස්වීම හෝ විශේෂ මහා සභා රැස්වීම හෝ අති විශේෂ මහා සභා රැස්වීම පැවැත්විය යුතු බවට විශේෂිතව දැක්වීම;

(ම) ජාත්‍යන්තර ක්‍රීඩා සංවිධානයේ විධිවිධාන සහ ශ්‍රී ලංකාවේ නීති අතර පරස්පරතාවයක් ඇති වුවහොත්,ශ්‍රී ලංකාවේ නීති ක්‍රියාත්මක වන බව විශේෂිතව දැක්වීම;

(ය) ශ්‍රී ලංකාවේ සෑම ග්‍රාම නිලධාරී වසමකම ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රාදේශීය ක්‍රීඩා සමාජ, දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් සහ පළාත් ක්‍රීඩා සංගම් පිහිටුවීමට උත්සාහ කළ යුතු බව විශේෂිතව දැක්වීම. ක්‍රීඩාවට ආදරය කරන සියලුම පුරවැසියන්ට තමන් කැමති ක්‍රීඩාවක නියැලීමේ මානුෂීය අයිතිය ලබා දීම එවැනි ක්‍රීඩා සංගමයක වගකීමකි.

EOG 05 - 0020

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.